# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
# තාවකාලික පදනම මත කණිෂ්ඨ සේවකයින් බඳවා ගැනීම

- ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
- පත්වීම් තාවකාලික පදනම මත වන අතර පැමිණීම මත පදනම් වූ දෛනික දීමනාවක් ගෙවනු ලැබේ.
- පළමු පත්වීම් කාලසීමාව අවසානයේදී වැඩ, හැසිරීම හා පැමිණීම මත සේවයේ නැවත පිහිටුවීම සඳහා සලකා බලනු ලැබේ.
- විශ්වවිද්‍යාලයීය ආකෘතියට අනුව පිළියෙල කළ අයදුම්පත් සහතික කල අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සහතික පිටපත් සහ උප්පැන්න සහතිකයේ හෝ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් සමඟ **ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ ගෙනවිත් භාරදිය හැකිය.
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2024.10.07**

## තෝරාගැනීමේ ක්‍රමවේදය

- ප්‍රායෝගික පරීක්ෂණ සහ / හෝ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල අනුව.

## පොදු කොන්දේසි

01. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

02. අයදුම්කරුවන් තෝරා ගැනීම ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව සහ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල පදනම් කරගෙන සිදු කරනු ලැබේ.

03. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

04. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.

05. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් (**https://kdu.ac.lk**) භාගත කර ගත හැකි ආකෘති පත්‍රය මඟින් පමණක් අදාළ තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට දන්වා සිටින අතර ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිබාහිරව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්ඩීකේසී සන්දනායක
වැඩබලන ලේඛකාධිකාරී

Acting Registrar
General Sir John Kotelawala Defence University
Ratmalana

## 01. කාන්තා භෝජනාගාර සේවක (තාවකාලික)
## (කාන්තා නේවාසිකාගාරය - වේරහැර)

**සුදුසුකම්**

1. 08 වන ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය.

2. පිළිගත් ආයතනයක භෝජනාගාර සේවකයෙකු වශයෙන් සේවා පළපුරුද්දක් තිබිය යුතුය.

3. වයස අවුරුදු 45 නොඉක්මවිය යුතුය.

- පිළිගත් ආයතනයකින් භෝජනාගාර සේවය සම්බන්ධ වෘත්තිමය පාඨමාලාවක් හදාරා ඇති අයට ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

**වැටුප් හා අනෙකුත් දීමනා**

- රු. **1,500/-**ක දෛනික වැටුපක් ද, සේවයට පැමිණීම මත රජයේ අනුමත අනෙකුත් දීමනාවන්හි දෛනික අනුපාතයක් ද ගෙවනු ලැබේ. ඒ අනුව රු. **2,260/-**ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ.

- තවද වැඩ කරනු ලබන දින 20ක් සඳහා මසකට රු. **45,200/-** ක දළ වැටුපක් ද මීට අමතරව සේවා අවශ්‍යතාවය මත සති අන්තයේද රාජකාරීන් සඳහා පැමිණිය හැකි අතර අතිකාල දීමනාද ගෙවනු ලැබේ.

**අනෙකුත් වරප්‍රසාද**

- සේවක අර්ථසාධක අරමුදලට ආයතනයෙන් 15% ක් ද සේවකයාගෙන් 10% ක් ද සේවක භාරකාර අරමුදලට ආයතනයෙන් 3% ක් ද බැර කරනු ලැබේ.

## 02. කාන්තා සනීපාරක්ෂක කම්කරු (තාවකාලික)
## (රත්මලාන පරිශ්‍රය සඳහා)

**සුදුසුකම්**

1. 08 වන ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය.

2. වැසිකිළි, නාන කාමර හා කාණු පද්ධති පිරිසිදු කිරීමට හැකියාව තිබිය යුතුය.

3. වයස අවුරුදු 45 නොඉක්මවිය යුතුය.

**වැටුප් හා අනෙකුත් දීමනා**

- රු. **1,500/-**ක දෛනික වැටුපක් ද, සේවයට පැමිණීම මත රජයේ අනුමත අනෙකුත් දීමනාවන්හි දෛනික අනුපාතයක් ද ගෙවනු ලැබේ. ඒ අනුව රු. **2,260/-**ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ.

- තවද වැඩ කරනු ලබන දින 20ක් සඳහා මසකට රු. **45,200/-** ක දළ වැටුපක් ද මීට අමතරව සේවා අවශ්‍යතාවය මත සති අන්තයේද රාජකාරීන් සඳහා පැමිණිය හැකි අතර අතිකාල දීමනාද ගෙවනු ලැබේ.

**අනෙකුත් වරප්‍රසාද**

- සේවක අර්ථසාධක අරමුදලට ආයතනයෙන් 15% ක් ද සේවකයාගෙන් 10% ක් ද සේවක භාරකාර අරමුදලට ආයතනයෙන් 3% ක් ද බැර කරනු ලැබේ.

## 03. රසායනාගාර සහයක (තාවකාලික)
## (රත්මලාන පරිශ්‍රය - පරිගණක පීඨය සඳහා)

**සුදුසුකම්**

1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 කින් සමත්ව තිබීම.

සහ

2. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් හෝ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනතක් මගින් ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් නිකුත් කරන ලද සම්මත පරිගණක විද්‍යාගාර උපකරණ සහ විද්‍යාගාර ශිල්පීය ක්‍රම පිළිබඳව දැනුමක් ඇති ක්ෂේත්‍රයක **NVQ 2** හෝ **NVQ 3** මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

පරිගණක හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ දැනුම සමඟ අවම වශයෙන් මාස 06ක සේවා පළපුරුද්ද සහ සම්මත පරිගණක විද්‍යාගාර උපකරණ භාවිතය, සැපයුම් සහ අවශ්‍ය පරිදි නව විද්‍යාගාර ශිල්පීය ක්‍රම ඉගෙනීමේ හැකියාව තිබිය යුතුය.

3. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 45 නොඉක්මවිය යුතුය.

**වැටුප් හා අනෙකුත් දීමනා**

- රු. **2,000/-**ක දෛනික වැටුපක් ද, සේවයට පැමිණීම මත රජයේ අනුමත අනෙකුත් දීමනාවන්හි දෛනික අනුපාතයක් ද ගෙවනු ලැබේ. ඒ අනුව රු. **2,760/-**ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ.

- තවද වැඩ කරනු ලබන දින 20ක් සඳහා මසකට රු. **55,200/-** ක දළ වැටුපක් ද මීට අමතරව සේවා අවශ්‍යතාවය මත සති අන්තයේද රාජකාරීන් සඳහා පැමිණිය හැකි අතර අතිකාල දීමනාද ගෙවනු ලැබේ.

**අනෙකුත් වරප්‍රසාද**

- සේවක අර්ථසාධක අරමුදලට ආයතනයෙන් 15% ක් ද සේවකයාගෙන් 10% ක් ද සේවක භාරකාර අරමුදලට ආයතනයෙන් 3% ක් ද බැර කරනු ලැබේ.

# 04. අරක්කැමි (තාවකාලික)
# (රත්මලාන පරිශ්‍රය සඳහා)

## සුදුසුකම්

1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ හතරක් සහිතව විෂයන් 06 කින් සමත්ව තිබීම.

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද අරක්කැමි / කාමර සහායක පිළිබඳ (**NVQ** මට්ටම 03) ජාතික සහතිකයක් ලබා තිබීම.

සහ

2. ගෘහ භාණ්ඩ, පිඟන් භාණ්ඩ, හැඳි ගැරුප්පු සහ ලිනන් රෙදි නිසියාකාරව පවත්වා ගෙන යාම සහ අවට උද්‍යානය නඩත්තු කිරීම පිළිබඳ දැනුමක් තිබිය යුතුය. බඩු තොග ලේඛන පවත්වා ගැනීමට හැකිවිය යුතුය.

සහ

3. දෙන ලද පුද්ගලයින් සංඛ්‍යාවක් සඳහා දේශීය / විදේශීය කෑම වර්ග පිළියෙල කිරීම පිළිබඳ දැනුමක් තිබිය යුතුය.

සහ

4. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 45 නොඉක්මවිය යුතුය.

## වැටුප් හා අනෙකුත් දීමනා

- රු. **2,000/-**ක දෛනික වැටුපක් ද, සේවයට පැමිණීම මත රජයේ අනුමත අනෙකුත් දීමනාවන්හි දෛනික අනුපාතයක් ද ගෙවනු ලැබේ. ඒ අනුව රු. **2,760/-**ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ.

- තවද වැඩ කරනු ලබන දින 20ක් සඳහා මසකට රු. **55,200/-** ක දළ වැටුපක් ද මීට අමතරව සේවා අවශ්‍යතාවය මත සති අන්තයේද රාජකාරීන් සඳහා පැමිණිය හැකි අතර අතිකාල දීමනාද ගෙවනු ලැබේ.

## අනෙකුත් වරප්‍රසාද

- සේවක අර්ථසාධක අරමුදලට ආයතනයෙන් 15% ක් ද සේවකයාගෙන් 10% ක් ද සේවක භාරකාර අරමුදලට ආයතනයෙන් 3% ක් ද බැර කරනු ලැබේ.

## 05. බීමහල් සේවක(තාවකාලික)
## (රත්මලාන පරිශ්‍රය සඳහා)

<u>සුදුසුකම්</u>

1. 08 වන ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය.

2. සිංහල / දෙමළ භාෂාව කියවීමට හා ලිවීමට හැකිවීම.

3. වයස අවුරුදු 45 නොඉක්මවිය යුතුය.

4. පිළිගත් ආයතනයක බීමහල් සේවකයකු වශයෙන් වසර 02 කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

<u>වැටුප් හා අනෙකුත් දීමනා</u>

- රු. **1,500/-**ක දෛනික වැටුපක් ද, සේවයට පැමිණීම මත රජයේ අනුමත අනෙකුත් දීමනාවන්හි දෛනික අනුපාතයක් ද ගෙවනු ලැබේ. ඒ අනුව රු. **2,260/-**ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ.

- තවද වැඩ කරනු ලබන දින 20ක් සඳහා මසකට රු. **45,200/-** ක දළ වැටුපක් ද මීට අමතරව සේවා අවශ්‍යතාවය මත සති අන්තයේද රාජකාරීන් සඳහා පැමිණිය හැකි අතර අතිකාල දීමනාද ගෙවනු ලැබේ.

<u>අනෙකුත් වරප්‍රසාද</u>

- සේවක අර්ථසාධක අරමුදලට ආයතනයෙන් 15% ක් ද සේවකයාගෙන් 10% ක් ද සේවක භාරකාර අරමුදලට ආයතනයෙන් 3% ක් ද බැර කරනු ලැබේ.

## 06. පොත් බැඳුම්කරු(තාවකාලික)
## (රත්මලාන පරිශ්‍රය සඳහා)

**<u>සුදුසුකම්</u>**

01. සිංහල / දෙමළ භාෂාව කියවීමට හා ලිවීමට හැකිවීම.

02. පොත් බැඳුම්කරුවෙකු වශයෙන් රාජ්‍ය ආයතනයක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසර 02 කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

03. වයස අවුරුදු 45 නොඉක්මවිය යුතුය.

<u>වැටුප් හා අනෙකුත් දීමනා</u>

- රු. **2,000/-**ක දෛනික වැටුපක් ද, සේවයට පැමිණීම මත රජයේ අනුමත අනෙකුත් දීමනාවන්හි දෛනික අනුපාතයක් ද ගෙවනු ලැබේ. ඒ අනුව රු. **2,760/-**ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ.

- තවද වැඩ කරනු ලබන දින 20ක් සඳහා මසකට රු. **55,200/-** ක දළ වැටුපක් ද මීට අමතරව සේවා අවශ්‍යතාවය මත සති අන්තයේද රාජකාරීන් සඳහා පැමිණිය හැකි අතර අතිකාල දීමනාද ගෙවනු ලැබේ.

<u>අනෙකුත් වරප්‍රසාද</u>

- සේවක අර්ථසාධක අරමුදලට ආයතනයෙන් 15% ක් ද සේවකයාගෙන් 10% ක් ද සේවක භාරකාර අරමුදලට ආයතනයෙන් 3% ක් ද බැර කරනු ලැබේ.